කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමුවන වසර පරීක්ෂණය (බාහිර)-2019

2023 - අප්‍රේල්

BCOME 1035 – මූල්‍ය ගිණුම්කරණය

ප්‍රශ්න සංඛ්‍යාව : හතරයි (04)

කාලය : පැය 03 යි

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

---

**ප්‍රශ්ණ අංක 01**

අ. මූල්‍ය ගිණුම්කරණයේ වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ආ. මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන ඇල්මක් දක්වන පාර්ශ්වකරුවන් හතර දෙනෙකු නම් කරන්න. ඔවුන් මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නේ කෙසේද ?

(ලකුණු 04)

ඇ. ගිණුම්කරණ පරිසරයේ සංරචක 05 නම්කරන්න. ඉන් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඉ. කළමනාකරණ ගිණුම්කරණය සහ මූල්‍ය ගිණුම්කරණය අතර වෙනස්කම් පැහැදිලි කරන්න.

(ලකුණු 12)

**(මුළු ලකුණු 25)**

**ප්‍රශ්ණ අංක 02**

අ. “ශාඛාවක් ” සහ “දෙපාර්තමේන්තුවක් ” අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 03)

ආ. යැපෙන ශාඛාවක් සහ ස්වාධීන ශාඛාවක් අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 02)

ඇ. පහත ගනුදෙනු ප්‍රධාන කාර්යාලයේ ගිණුම් පොත් වල සහ ශාඛාවේ ගිණුම් පොත් වල වෙන වෙනම සටහන් කරන්න.

i. ශාඛාවට යවන ලද භාණ්ඩ තොගය / ප්‍රධාන කාර්යාලයෙන් ලද භාණ්ඩ තොගය - රු.1,225,000.

ii. ඉහත භාණ්ඩ තොගයෙන් රු.125,000 ක් වටිනා භාණ්ඩ නැවත ප්‍රධාන කාර්යාලය වෙත හරවා යවන ලදී.

iii. ශාඛාව විසින් දරන ලද ශාඛා වියදම් - රු.50,000.

iv. ප්‍රධාන කාර්යාලය විසින් දරන ලද ශාඛාවේ ගොඩනැගිලි කුලී රු.158,000.

v. ශාඛාව විසින් රු.650,000 ක් වටිනා භාණ්ඩ තොගයක්, තුන්වන පාර්ශවයකින්, ණය පදනම මත මිලදී ගන්නා ලදී.

vi. ශාඛා විකුණුම් වටිනාකම (ණය පදනම මත) - රු.7,925,000.

vii. ශාඛාවට අදාල ණයගැතියන්, ප්‍රධාන කාර්යාලය වෙත කළ ගෙවීම් රු.420,000.

viii. ප්‍රධාන කාර්යාලය විසින්, රු.90,000 ක් වටිනා ශාඛා ගැනුම් දරන ලදී.

ix. ශාඛාව මිලදී ගත් උපකරණ රු.620,000.

x. ශාඛාව විසින්, රු.520,000 ක් වටිනා පරිගණකයක් ඔවුන්ගේ භාවිතය සඳහා මිලදී ගන්නා ලදී. නමුත්, එම පරිගණකයට අදාල ගිණුම ප්‍රධාන කාර්යාලයේ පොත්වල පවත්වා ගෙන යන ලදී.

(ලකුණු 20)

**(මුළු ලකුණු 25)**

ප්‍රශ්ණ අංක 03

අ. 2022 වර්ෂයේ මාර්තු 31 දිනට පෙරේරා සහ සමන් හවුල්ව්‍යාපාරයේ මූල්‍ය තත්වය පහත දැක්වේ.

| ප්‍රාග්ධනය/ වගකීම් | වටිනාකම (රු.) | වත්කම් | වටිනාකම (රු.) |
|---|---|---|---|
| සංචිත අරමුදල | | ගොඩනැගිලි | 1,105,000 |
| පෙරේරා මහත්මිය | 920,000 | කීර්තිනාමය | 541,000 |
| සමන් මහතා | 830,000 | ආයෝජන | 200,000 |
| ආයෝජන උච්චාවචන අරමුදල | 152,000 | ණයගැතියෝ – වෙන්කිරීම් (200,000 - 25,000) | 175,000 |
| පෙරේරා මහත්මියගේ ණය | 50,000 | භාණ්ඩ තොග | 142,000 |
| සමන් මහතාගේ ණය | 45,000 | බැංකු මුදල් | 132,000 |
| ණයහිමියෝ | 298,000 | | |
| එකතුව | 2,295,000 | එකතුව | 2,295,000 |

2022 වර්ෂයේ මාර්තු 31 වන දින හවුල්කරුවන් විසින් හවුල්ව්‍යාපාරය විසුරුවාහැරීමට තීරණය කරන ලද අතර එදින පහත ගනුදෙනු වාර්තා විය.

i. හවුල්ව්‍යාපාරය විසින් රු.35,000 ක් වටිනා භාණ්ඩ තොගයක් පවරා, පෙරේරා මහත්මියගේ ණය මුදල පියවන ලදී.

ii. සමන් මහතා විසින් හවුල්ව්‍යාපාරයේ ආයෝජන වලින් හරි අඩක්, එහි වටිනාකමෙන් 10%ක් අඩුවෙන් පවරා ගන්නා ලදී.

iii. ණයගැතියෝ රු.200,000 කට උපලබ්ධි විය.

iv. රු.11,000ක් අඩුවෙන් ණයහිමියෝ පියවන ලදී.

v. ගොඩනැගිලි රු.1,500,000 කට උපලබ්ධි විය.

vi. කීර්තිනාමය රු.600,000 කට නැවත තක්සේරු කර ඇත.

vii. හවුල්ව්‍යාපාරයේ ඉතිරි ආයෝජන රු.45,000 කට විකුණන ලදී.

viii. හවුල්ව්‍යාපාරයේ පොත්වල වාර්තා නොවූ පැරණි ගෘහභාණ්ඩ කට්ටලයක්, පෙරේරා මහත්මිය විසින් රු.45,000 කට පවරාගන්නා ලදී.

ix. උපලබ්ධි වියදම රු.25,000 කි.

පහත ගිණුම් පිළියෙල කරන්න.

a) උපලබ්ධි ගිණුම

b) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්

c) බැංකු ගිණුම

(ලකුණු 15)

ආ. පහත දැක්වෙන යෙදුම් කෙටියෙන් පැහැදිලිකරන්න.

i. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම (LKAS 01)

ii. තොග (LKAS 02)

iii. දේපල,පිරියත සහ උපකරණ (LKAS 16)

iv. ණය ගැනීමේ පිරිවැය (LKAS 23)

v. කල්බදු (LKAS 17)

vi. සාධාරණ වටිනාකම මිනුම්කරණය (SLFRS 13)

(ලකුණු 2 x 5 = 10)

**(මුළු ලකුණු 25)**

**ප්‍රශ්ණ අංක 04**

අ. හවුල්ව්‍යාපාරයක් ඒකාබද්ධ කිරීමේ ප්‍රධාන අරමුණු හුවාදක්වමින්, 'හවුල්ව්‍යාපාර ඒකාබද්ධ කිරීම' යන යෙදුම පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. මාර්ටින් සහ නයෝන් හවුල් ව්‍යාපාර සහ ඔමේගා සහ පීටර් හවුල් ව්‍යාපාරය යන ව්‍යාපාර යුගලය, 2023 වර්ෂයේ ජනවාරි 01 දින 'ප්‍රින්ස්ටන් වෙළඳ සමාගම' යන නමින් ඒකාබද්ධ කිරීමට එකඟ විය. මාර්ටින් සහ නයෝන් හවුල් ව්‍යාපාරයේ සහ ඔමේගා සහ පීටර් හවුල් ව්‍යාපාරයේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍ර පහත පරිදි විය.

| හිමිකම්/ වගකීම් | මාර්ටින් සහ නයෝන් හවුල් ව්‍යාපාරය (රු. 000) | ඔමේගා සහ පීටර් හවුල් ව්‍යාපාරය (රු. 000) | වත්කම් | මාර්ටින් සහ නයෝන් හවුල් ව්‍යාපාරය (රු. 000) | ඔමේගා සහ පීටර් හවුල් ව්‍යාපාරය (රු. 000) |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් | | | ගොඩනැගිලි | 18,000 | - |
| මාර්ටින් | 30,000 | - | කීර්තිනාමය | - | 10,000 |
| නයෝන් | 20,000 | - | ආයෝජන | 20,000 | - |
| ඔමේගා | - | 15,000 | ණයගැතියෝ | 12,000 | 24,000 |
| පීටර් | - | 15,000 | භාණ්ඩ තොග | 30,000 | 26,000 |
| පොදු සංචිත | 20,000 | - | | | |
| ණයහිමියෝ | 10,000 | 22,000 | | | |
| බැංකු ණය | - | 8,000 | | | |
| | | | | | |
| එකතුව | 80,000 | 60,000 | එකතුව | 80,000 | 60,000 |

මාර්ටින් සහ නයෝන් ඔවුන්ගේ ප්‍රාග්ධනයට සමානුපාතිකව ලාභා/අලාභ බෙදාගත් අතර, ඔමේගා සහ පීටර් සමානව ලාභා/අලාභ බෙදාගන්නා ලදී.

ඒකාබද්ධකිරීමේ කොන්දේසි පහත පරිදි විය:

I. නව සමාගම වන ප්‍රින්ස්ටන් වෙළඳ සමාගම විසින්, මාර්ටින් සහ නයෝන් හවුල් ව්‍යාපාරයට අයිති ගොඩනැගිල්ල රු.23,000,000 ක වටිනාකමකට පවරාගන්නා ලදී.

II. නමුත්, මාර්ටින් සහ නයෝන් හවුල් ව්‍යාපාරයේ ආයෝජන, ප්‍රින්ස්ටන් වෙළඳ සමාගම විසින් පවරා නොගන්නා ලදී.

III. ඔමේගා සහ පීටර් හවුල් ව්‍යාපාරයෙහි කීර්තිනාමය වටිනාකමක් නැතැයි එකඟ විය.

IV. ඉහත ගැලපීම් වලින් පසු, රු.5,000,000 බැගින් අමතර ප්‍රාග්ධනය නව ව්‍යාපාරයට යෙදවීමට ඔමේගා සහ පීටර් එකඟ විය.

අවශ්‍ය වන්නේ;

a.) මාර්ටින් සහ නයෝන් හවුල් ව්‍යාපාරයෙහි ගිණුම් පොත් වසාදැමීම සඳහා, 2023 ජනවාරි 01 දිනට ලෙජර් ගිණුම් පිළියෙළ කිරීම.

(ලකුණු 07)

b.) ඔමේගා සහ පීටර් හවුල් ව්‍යාපාරයෙන් ගිණුම් පොත් වසාදැමීම සඳහා, 2023 ජනවාරි 01 දිනට ලෙජර් ගිණුම් පිළියෙළ කිරීම.

(ලකුණු 08)

C.) 2023 ජනවාරි 01 දිනට ප්‍රින්ස්ටන් වෙළඳ සමාගමෙහි ශේෂ පත්‍රය පිළියෙළ කිරීම.

(ලකුණු 05)

**(මුළු ලකුණු 25)**